දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449, 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
E-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය ) TA/TUT/PSM/PHA/02/2019
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2022. 10-20
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

**පොදු චක්‍රලේඛ ලිපි අංක:- 02 – 63 / 2022**

රේඛීය අමාත්‍යාංශයට අයත් සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන් හා ආයතන ප්‍රධානීන්,

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඖෂධවේදී පුහුණු පාසල් සඳහා ජ්‍යෙෂ්ඨ ආචාර්ය ඖෂධවේදී තනතුරට බඳවා ගැනීම</u>**

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන ඖෂධවේදී පුහුණු පාසල් සඳහා ජ්‍යෙෂ්ඨ ආචාර්ය ඖෂධවේදී තනතුරට පහත සඳහන් සුදුසුකම් හා කොන්දේසි සපුරා ඇති සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන සෞඛ්‍ය ආයතනයන්හි/රෝහල්වල සේවයේ නියුතු ඖෂධවේදී නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. අධ්‍යාපන හා වෙනත් මූලික සුදුසුකම් :-**

I. ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. අදාල තනතුරෙහි අධි ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ I වන ශ්‍රේණියේ වසර 05ක සක්‍රීය සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
V. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.
VI. පළමුවන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබිය යුතුය.
VII. ජාතික සෞඛ්‍ය විද්‍යායතනය විසින් පවත්වනු ලබන ඉගැන්වීම පිළිබඳ මාස 06 ක පුහුණු පාඨමාලාව සාර්ථකව නිමකර තිබීම හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මාස 06 කට නොඅඩු ඉගැන්වීම් පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබිය යුතුය.
VIII. ඖෂධවේදී ආචාර්ය තනතුරේ වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
IX. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

**2. වයස් සීමාව**

බඳවා ගැනීම් සිදු කරනුයේ ඖෂධවේදී තනතුරුවල දැනටමත් සේවයේ නියුක්ත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අතුරින් බැවින් උපරිම වයස් සීමාව අදාල නොවේ.



Page 1 / 3 Zoom 100%